සමේ වර්ණය පදනම් කරගනිමින් පොදුවේ බොහෝ විදේශිකයින් "සුද්දන්" ලෙසින් හැඳින්වීමේ භාවිතාවක් ශ්‍රී ලංකාවේ දක්නට ලැබේ. කෙසේ නමුත්, "සුද්දන්" යන යෙදුම හා බැඳී ඇති සමාජ ආකල්පයන්ද සමගින් ගත් විට, විදේශිකයින්ව "සුද්දන්" ලෙසින් හැඳින්වීම ඔස්සේ, ඔවුන්ගේ සමේ වර්ණය පදනම් කරගත් කොන් කිරීමක් සිදු නොවන්නේදැයි පාඨක අප විමසිය යුතුයි.

විදේශිකයෙකු, ව්‍යාජ ගුවන් ගමන් බලපත්‍රයක් භාවිත කරමින් ප්‍රංසයට පැන යෑමට තැත් කළ අවස්ථාවේදී අත්අඩංගුවට ගැනුණු බවට වන පුවතක් ජනවාරි 11 දින මුද්‍රිත මාධ්‍ය ඔස්සේ වාර්තා වී තිබූ ආකාරය මෙහිදී අවධානයට ගැනීම වටී.

එහිදී ඇතැම් පුවත්පතක් "සුද්දෙක්", "සුද්දා" යන යෙදුම් ඔස්සේ අදාළ පුද්ගලයාව හඳුන්වා තිබූ අතර, තවත් පුවත්පත් මගින් ඔහුව "විදේශිකයා", "පෝලන්ත ජාතිකයා" යනුවෙන් හඳුන්වා දී තිබිණි.

ඒ අනුව, වඩාත් යෝග්‍ය යැයි ඔබ තෝරාගන්නා සිරස්තල මොනවාද?